# ශ්‍රී ලංකාවේ වැඩිහිටියන් පිළිබඳ
# ජාතික ප්‍රතිපත්තිය (2025 - 2035)

ශ්‍රී ලංකාවේ ජන විකාශන පරිවර්තනයත් සමගින් වැඩිහිටි ජනගහනයෙහි සීඝ්‍ර වර්ධන ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. වියපත් වීම යනු නොනවතින ජෛව ක්‍රියාවලියක් වන අතර, එමගින් වැඩිහිටියන්ගේ කායික, මානසික සහ සාමාජීය වෙනස්වීම් ඇති වේ. වයස අවුරුදු 60 ඉක්මවූ ඕනෑම පුද්ගලයෙක්, ශ්‍රී ලංකාවේ වැඩිහිටියෙකු ලෙස නිර්වචනය කෙරේ. වැඩිහිටියන් විසින් සිය පවුල්, ප්‍රජාවන් සහ ජාතික සංවර්ධනයෙහිලා කරනු ලබන අගනා දායකත්වය අගය කරමින් ඔවුන්ගේ අයිතිවාසිකම්, අභිමානය සහ යහපැවැත්ම සහතික කිරීමත්, සුරැකීමත් කළ යුතුය.

වැඩිහිටියන්ගේ සහභාගීත්වය හා ඔවනුගේ ආත්ම අභිමානය, ගරුත්වය රැකෙන වැඩිහිටි හිතකාමී සමාජයක් ගොඩනැගීමට රජයේ කැපවීම, පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තිය අවධාරණය කරයි. වැඩිහිටියන් සඳහා වූ මැඩ්රිඩ් ජාත්‍යන්තර ක්‍රියාකාරී සැලසුම (2002), එක්සත් ජාතීන් විසින් නම්කරන ලද සුවබර වැඩිහිටි දිවියක් සඳහා වූ දශකය (2021 - 2030) සහ ශ්‍රී ලංකාවේ, 2000 අංක 9 දරන, වැඩිහිටි පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සුරැකීමේ පනත සහ එහි සංශෝධන යනාදී ගෝලීය නෛතික ආකෘති මෙ ප්‍රතිපත්තිය සැකසීමේදී දායක වී ඇත. වැඩිහිටි පුද්ගලයින්ගේ බහුවිධාකාර අවශ්‍යතා පිළිබඳව සොයා බැලීමටත්, වියපත්වීමේදී සෞඛ්‍ය සම්පන්න ක්‍රියාකාරී දිවියක් ප්‍රවර්ධනය සහ අන්තර් පරම්පරා සම්බන්ධ ඒකතාභාවය යනාදී අංශත් මෙම ප්‍රතිපත්තිය මගින් හුවාදක්වා ඇත. මෙම ප්‍රතිපත්තිය මගින් සම්පූර්ණ ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කිරීමට ද හැකියාව ඇත. මෙම ප්‍රතිපත්තියේ ගැබ්ව පවතින සම්බන්ධීකාරක, නිරීක්ෂණ පාදක සහ අයිතිවාසිකම් කේන්ද්‍රගත ප්‍රවේශයන් මගින් නිදහසේ, ආරක්ෂිතව සහ ගෞරවාන්විතව ජීවත්වීම අරභයා වැඩිහිටි පුද්ගලයින් බලගැන්වීම, මේ ප්‍රතිපත්තියේ අරමුණයි.

රටේ සෑම පරම්පරාවකම ජනතාවට අනෝන්‍ය ගරුත්වයෙන් සහ බෙදාහදාගත් වගකීමෙන් යුක්තව විසියහැකි තිරසාර අනාගතයක් බිහිකරලීමට, මෙම ප්‍රතිපත්තිය මෙහෙයවන ශ්‍රී ලංකාව පොරොන්දු වේ.

## 1.0 වැඩිහිටියන් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීමේ අවශ්‍යතාව

ශ්‍රී ලංකාවේ සීඝ්‍රයෙන් වර්ධනයවන වැඩිහිටි ජනගහනය සඳහා අභියෝගවලට විසඳුම් සෙවීම අරභයා රටට වැඩිහිටි පුද්ගලයින් උදෙසා සැකසූ අංගසම්පූර්ණ ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍ය කෙරේ. දකුණු ආසියා කලාපයේ සීඝ්‍රයෙන් වැඩිවන වියපත් ජනගහනයක් පවතින ශ්‍රී ලංකාව අඩුවෙමින් යන සඵලතා අනුපාත සහ ආයු අපේක්ෂාව ඉහළයෑම වැනි සාධක මගින් දැක්වෙන පරිදි සැළකියයුතු ජනවිකාශණ පරිවර්ථනයකට මුහුණපා සිටී. ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව අනුව (2012, 2024) වයස අවුරුදු 60 සහ ඊට ඉහළ ජනගහනය 1981 පැවති 6.6% සිට 2012 දී 12.4% ක් තරම් දෙගුණයකින්ද, 2024 දී එය 18.2% දක්වාද ඉහළ ගොස් තිබේ.

සම්ප්‍රදායික පවුල් පදනම් වූ සහන සැපයීමේ ක්‍රම මෙන්ම රජයෙන් ක්‍රියාත්මක වන වැඩිහිටි සේවාවන් සඳහා ද අභියෝග එල්ල කරමින්, වැඩිහිටි යැපුම් අනුපාතය ක්‍රමිකව ඉහළ යමින් පවතී. පවුලේ වැඩිහිටි සාමාජිකයින් රැකබලා ගැනීමේ සම්ප්‍රදායික විස්තෘත පවුල් ආකෘතියේ පැවති ක්‍රමයන් විදේශ සංක්‍රමණය වැනි ඉහළ විගමනික අනුපාත හමුවේ අභියෝගයට පත්ව ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, වැඩිහිටි පුද්ගලයින් රැකවරණ සැපයීමේදී සහ සමාජ සම්බන්ධතා පවත්වා ගැනීමේදී ගැටළුකාරී තත්වයන්ට මුහුණපා ඇත. තවද, වැඩිහිටි ජනගහනය වර්ධනය වීමට සාපේක්ෂව එහි කාන්තා වැඩිහිටියන් වැඩි සංයුතියක් පැවතීමද, තත්වය වඩාත් සංකීර්ණ කර තිබේ. දිගු ආයු අපේක්ෂාව, ජීවන ආදායම පහතයෑම සහ මූල්‍ය ආරක්ෂණයට ඇති ප්‍රවේශ වැනි කරුණු නිසා, වැඩිහිටි කාන්තාව, දරිද්‍රතාව, සමාජ වියුක්ත බව සහ සෞඛ්‍ය පහසුකම් සඳහා අභියෝග වලට මුහුණපායි.

වියපත්වීම, ස්වභාවික ජීවවිද්‍යාත්මක ක්‍රියාවලියක් වුවත්, එහි සමාජීය, සෞඛ්‍යමය සහ ආර්ථික අභියෝග සඳහා කඩිනම් ප්‍රගතිගාමී ප්‍රතිපත්තිමය ප්‍රතිචාර අවශ්‍ය කෙරේ. නිසි සැලසුම් නොමැති වූ විටෙක සෞඛ්‍ය, වැඩිවන මූල්‍ය අනාරක්ෂිතතාවයන් සහ සමාජ කොන්වීමේ ඇතුළු සමාජීය අනාරක්ෂිතතාවයන් වැනි අභියෝග ඇතිවිය හැක.

වැඩිහිටි ජනගහනයේ යහපැවැත්මට හානිදායක විය හැකි බැවින්, ඒ පිළිබඳව තිරසාරබවින් කටයුතු කිරීමට සහ සමාජ ආරක්ෂණයටත්, ජාතික ස්ථාවරත්වයටත් වැඩිහිටියන් සඳහා වූ ප්‍රතිපත්තිමය ප්‍රතිචාර අවශ්‍ය කෙරේ.
ජනගහනය වියපත්වීම තුළින්, ක්‍රමෝපායිකව වැදගත් අවස්ථාවන් ද උදාකරයි. වැඩිහිටි පුද්ගලයින් උපස්ථානයෙන්, ස්වේච්ඡාවෙන් සහ ප්‍රජා කටයුතුවලට සහභාගීවීම පමණක් මගින් නොව, දැනුම ලබාදීමෙන් කුසලතා සහ ජීවන අත්දැකීම් තුළින්, නවෝත්පාදන, මාර්ගෝපදේශණය මෙන්ම ශ්‍රම හමුදා ඔරොත්තුදීමේ ගුණාංග කියාදීමෙන්ද, සමාජයේ ක්‍රියාකාරී දායකත්වයක් සපයයි. සාම්ප්‍රදායික විශ්‍රාම වයස ඉක්මවා, විශේෂයෙන් වැඩිහිටි හිතකාමී පරිසරයක් ඇතිවිටදී, ආර්ථිකමය වශයෙන් සඵලදායී සේවයක් සැපයීමද, වැඩිහිටි ජනගහනයේ සැළකිය යුතු ප්‍රතිශතයකින් ඉටුවේ.

වැඩිහිටි පුද්ගලයින් සඳහා මනාව සැකසූ ජාතික ප්‍රතිපත්තියක් තුළින්, මෙකී බහු ආංශික අභියෝග සඳහා පිළිතුරු සැපයිය හැකිවේ. ප්‍රතිපත්තිය තුළින්, ක්‍රියාකාරී සහ සෞඛ්‍ය සම්පන්න වැඩිහිටි වයසත්, ගුණාත්මක වැඩිහිටි උපස්ථාන සේවාවක් සඳහා ප්‍රවේශවීම සියළු සේවා සමසේ ලබාදීම මෙන්ම විශ්‍රාම දීමනා සහ ප්‍රජා පාදක සේවාවන්ද ඇතුළු සහාය සැපයීම් ප්‍රවර්ධනය කළ යුතුය. ජාතික සංවර්ධන ක්‍රියාවලියේදී වැඩිහිටි පුද්ගලයින්ගේ හැකියා සහ සමාජ සහභාගීත්වය, ජාතියේ වත්කමක් ලෙස හඳුනාගෙන එය දිරිගැන්වීමද, මෙම ප්‍රතිපත්තියෙන් ඉටුවිය යුතුය. එපමණක් නොව වඩා නම්‍යශීලී රැකියා විකල්ප, කුසලතා ඔප්නංවා ගැනීමේ වැඩසටහන් සහ ඔවුන්ගේ ශ්‍රම දායකත්වය අඛණ්ඩ සහභාගීත්වය සැපයීම සඳහා සහාය සැපයෙන ස්වේච්ඡා අවස්ථාව සැපයීම තුළින්, වැඩිහිටි පුද්ගලයින්ට සඵලදායී සහ සමාජීය වශයෙන් ක්‍රියාකාරී අන්දමින් සිටීමට, මෙම ප්‍රතිපත්තිය තුළින් අවස්ථා උදාකළ යුතුය.

මෙම ප්‍රතිපත්තිය තුළින් අන්තර් පරම්පරා අතර සම්බන්ධීකරණය ඔප්නැංවීම සහ සුරැකීම, අන්‍යෝන්‍ය ගරුත්වය වැඩිවීම ප්‍රවර්ධනය කිරීමෙහිලා වැදගත් වේ. වැඩිහිටි පුද්ගලයින් සඳහා වන ජාතික ප්‍රතිපත්තිය, ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතිය, ආර්ථික තිරසාර බව සහ දිගු කාලීන වැඩිහිටියන්ගේ යහපැවැත්ම රැකගැනීමෙහිලා අත්‍යාවශ්‍ය අංගයකි.

## 2.0 දැක්ම

ශ්‍රී ලංකාවේ වැඩිහිටි පුද්ගලයින්ට, සෞඛ්‍ය, මූල්‍යමය සහ සමාජාරක්ෂණය සඳහා සම ප්‍රවේශ අවස්ථා සැපයෙන අතරම ඔවුන්ට පවුලේ සහ සමාජීය ජීවිතයක් ගතකිරීම සඳහා අර්ථවත් අවස්ථා සැපයෙන අයුරින් අභිමානයෙන්, නිදහසේ සහ ආරක්ෂිතව ජීවත්වීමට සැළසීම.

## 3.0 මෙහෙවර

(අ) වැඩිහිටි පුද්ගලයින්ට ක්‍රියාකාරී, අභිමානවත් ජීවිත ගතකරමින් තම පවුලට සහ ප්‍රජාවට අර්ථවත් ලෙසින් දායකවීම පහසුකරවන පරිදි ඔවුන්ගේ සෞඛ්‍ය, ආරක්ෂාව, උපස්ථානය සහ සහභාගීත්වය සඳහා සැපයෙන, සැමට එකලෙස අයිතිවාසිකම් පාදක ක්‍රමයක් ස්ථාපිත කිරීම.

(ආ) සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක්, මූල්‍ය ආරක්ෂාවක් සහ වියපත්වීම පිළිබඳ ධනාත්මක ජීවන ප්‍රගමන ප්‍රවේශය ප්‍රවර්ධනය කරමින්, වියපත්වීම කෙරෙහි ආත්ම විශ්වාසයකින් සූදානම්වීම අරභයා, ස්ත්‍රී/පුරුෂ බව හෝ පසුබිම නොතකා සියළු වැඩිහිටි පුද්ගලයින් බලාත්මක කිරීම.

## 4.0 මූලික සිද්ධාන්ත

ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනයේ අයිතිවාසිකම්, අභිමානය සහ සුභසිද්ධිය නගාසිටුවීමෙහිලා රටේ කැපවීම පිළිබිඹු කෙරෙන මූලික සිද්ධාන්ත කීපයකින් මෙම ජාතික ප්‍රතිපත්තිය සැකසීම සහ ක්‍රියාත්මක කිරීම පදනම් වේ. මෙකී සිද්ධාන්ත වලින්, ප්‍රතිපත්තිමය පියවර ගැනීමේදී වැඩිහිටියන්ගේ සහභාගීත්වය, සමතාව හිමිවන සහ තිරසාර අන්දමින් සිදුකිරීමට අවශ්‍ය ආචාරධර්ම සහ ක්‍රමෝපායික පදනම සපයයි.

මෙකී සිද්ධාන්ත සමගාමීවන ජාත්‍යන්තර ආකෘති අතර, වැඩිහිටි පුද්ගලයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ සිද්ධාන්ත වියපත්වීම පිළිබඳ මැඩ්රිඩ් ජාත්‍යන්තර ක්‍රියාකාරී සැලසුම සහ වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සහ වැඩිහිටියන්ගේ පාදක සඵලදායී ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා පදනම් උපදෙස් මාලා පාදක කරගනී. මෙකී ගෝලීය කැපවීම තුළින් වැඩිහිටියන්ගේ නිදහස, සහභාගීත්වය, උපස්ථානය, ස්වයං සාධනය සහ අභිමානය අවධාරණය කෙරේ.

මෙම ප්‍රතිපත්තිය සැකසීමේදී ඉහත කී උපදෙස්මාලාවන්ට අනුගතවීමෙන් අරමුණු කෙරෙන්නේ, ශ්‍රී ලංකාවේ වැඩිහිටි පුද්ගලයින් තම පවුලට, ප්‍රජාවට මෙන්ම ජාතික සංවර්ධනයටද අර්ථවත් ලෙසින් දායකත්වය සපයමින්, සුරක්ෂිත, අභිමානවත් සහ ස්වයං සාධන ජීවිත ගතකරනු සාක්ෂාත් කරදීමයි.

### (1) මානව හිමිකම් සහ අභිමානය

ශ්‍රී ලංකාවේ වැඩිහිටි පුද්ගලයින් යනු ස්වාධිකාරයත්, සුරක්ෂාවත් සහ අර්ථවත් සහභාගීත්වයකට හිමිකම් ඇති, මානව හිමිකම් යුතුකම් පිළිබඳ ජාතික සහ ජාත්‍යන්තර නීති ප්‍රකාර රැකවරණය ඇති සමාජයේ සමාන සහ අභිමානවත් සාමාජිකයින් වන බව සමාන ලෙස සැලකුම් ලැබීම සහ අවස්ථා ලැබබීම සහතික කරලනුවස්, වයස පාදක සෑම ආකාරයකම වෙනස්කොට සැලකීම් පිටුදැකිය යුතුය.

### (2) ජීවන චක්‍රයේ මාර්ග දැක්ම සහ අන්තර් පරම්පරා සම්බන්ධතාවය

පුළුල් මානව ජීවන චක්‍රයේ එක් කොටසක් ලෙසින් සාමස්තික අවබෝධයක් ප්‍රවර්ධනය කිරීම සහ පරම්පරා අතර අන්‍යෝන්‍ය ගරුත්වය, සහයෝගීතාව සහ බෙදාහදාගත් වගකීම ප්‍රවර්ධනය කිරීම.

### (3) සාධාරණත්වය, අන්තර්කරණය සහ විවිධත්වය ගරුකිරීම.

වැඩිහිටි පුද්ගලයින්ගේ ස්ත්‍රී/පුරුෂ බව, පදිංචිය, හැකියාව, වාර්ගිකත්වය හෝ සමාජාර්ථික තරාතිරම නොතකා අවස්ථා සපයාදීමේ සමාන ප්‍රවේශ සාක්ෂාත් කිරීම මෙන්ම තවද, වියපත් ජනගහනයේ, සංස්කෘතික, ආගමික, වාග්විද්‍යාත්මක සහ පුද්ගල විවිධතා වලට මෙහිදී ගරුකළ යුතුවේ.

### (4) අනාරක්ෂිත සමාජ කණ්ඩායම්වල සුරක්ෂාව, බලගැන්වීම සහ ස්වයං සාධනය

වැඩිහිටි කාන්තාවන්, ආබාධිත පුද්ගලයින්, පවුලේ රැකවරණය, නොලබන අය සහ උග්‍ර දරිද්‍රතාවෙන් පෙළෙන අයද ඇතුළත්ව විවිධාකාරයෙන් වරප්‍රසාද අහිමිවූ වැඩිහිටි පුද්ගලයින්ගේ සුරක්ෂිතතාව සහ බලගැන්වීම උදෙසා ප්‍රමුඛතාව සැපයීම. වැඩිහිටි පුද්ගලයින්ට තම ජීවිතය පිළිබඳව ස්වාධිකාරී සහ ස්වයං නිර්ණ, තොරතුරු දත්වරණ හෝ තීරණ ගැනීමට, ප්‍රතිපත්ති මගින් සහාය සැපයිය යුතුය.

**(5) සහභාගීත්වය සහ ක්‍රියාකාරීව රැඳීසිටීම**

වැඩිහිටි පුද්ගලයින් සිය සමාජීය, ආර්ථිකමය, සංස්කෘතික සහ ප්‍රජා ජීවිතයේදී අඛණ්ඩ සහභාගීත්වය දැරීමට පහසුකම් සැපයීම සහ ඇගයීම. ප්‍රතිපත්ති සංවර්ධන, සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී, ඔවුන්ගේ හඬ සක්‍රීයව අඩංගගු කළ යුතුය.

**(6) තිරසාර බව, සම්බන්ධීකරණය සහ වගකීම බෙදාහදා ගැනීම**

රාජ්‍ය අංශය, සිවිල් ප්‍රජාව, පවුල් සහ පෞද්ගලික අංශය ඒකාබද්ධ ලෙස සම්බන්ධීකරණය කරමින්, තිරසාරවූත්, ප්‍රජාව පාදක කරගන්නාවූත් උපස්ථාන ආකෘති ප්‍රවර්ධනය කිරීම. කාලයත් සමඟ සිදුවන ජනවිකාශණ සහ සමාජීය වෙනස්වීම්වලට අනුගතවිය හැකි පරිදි මෙම ප්‍රතිපත්ති පැවතිය යුතුය.

**(7) ප්‍රවේශය සහ සාමස්තික සහාය**

ආබාධ සහිත අය ඇතුළු වැඩිහිටි පුද්ගලයින්හට සැපයෙන සේවා, පහසුකම්, වටපිටාව සහ තොරතුරු, ඔවුන්ට ශාරීරිකව, ආර්ථිකව සහ සාමාජීයව ප්‍රවේශවිය හැකි ලෙස සැපයෙන බවට වගබලා ගත යුතුය. සෞඛ්‍ය ගැටළු පමණක් නොව, සාමස්තික ප්‍රවේශයකින් සමාජීය අඩංගු කරගැනීම, භාවමය සුභ සාධනය සහ මූල්‍යමය ආරක්ෂණය යනාදියද ආවරණය විය යුතුය.

(8) තීරණ ගැනීම, ප්‍රතිපත්ති සම්පාදනය, පවත්නා යතාර්ථයන්ට අනුකූලවන ආකාරයට සිදුකිරීමටත්, අනාගත අභියෝග මතුවූවිට ඊට අනුගතවීමටහැකි ආකාරයටත් ඉටුකළහැකි පරිදි, විශ්වාසනීය දත්ත, පර්යේෂණ සහ හොඳම භාවිතා අනුගමනය කරන්න.

**5.0 ප්‍රතිපත්ති අභිමතාර්ථ**

වැඩිහිටි පුද්ගලයින්ගේ අභිමානය, අයිතිවාසිකම් සහ යහ පැවැත්ම ආරක්ෂා කිරීමෙහිලා, රජයේ කැපවීම, වැඩිහිටි පුද්ගලයින් සඳහාවන ජාතික ප්‍රතිපත්තියෙන් කියැවේ. ජාතික සංවර්ධන ඉලක්ක මෙන්ම ඊට අනුෂාංගික ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායට සමගාමීව, ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනයේ මතුවන අවශ්‍යතාවලට පිළිතුරු සැපයීම උදෙසා මෙම ප්‍රතිපත්තිය මගින් සාමස්තික, ජීවන ප්‍රගමණ සහ අයිතිවාසිකම් පාදක ප්‍රවේශයක් අනුගමනය කෙරේ.

පියවර ගැනීම සඳහා පැහැදිලි මගපෙන්වීමටත්, ආශ්‍රිත පාර්ශව අතර කටයුතු සම්බන්ධීකරණය පහසුකරවීමටත් සඵලදායී අධීක්ෂණය සහ ඇගයුම පිණිසත්, පහත දැක්වෙන ප්‍රතිපත්ති අභිමතාර්ථ සකසා තිබේ.

**1. වැඩිහිටි පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සුරැකීම සහ ගරු කිරීම**

එක්සත් ජාතීන්ගේ, වැඩිහිටි පුද්ගලයින් පිළිබඳ සිද්ධාන්ත සහ වියපත්වීම පිළිබඳ මැඩ්රිඩ් ජාත්‍යන්තර ක්‍රියාකාරී සැලසුම යනාදී ජාත්‍යන්තර බැඳීම් සහ ජාතික නීති ප්‍රකාර, වැඩිහිටි පුද්ගලයින්ගේ සමාන අයිතීන් සහ ඔවුනට වෙනස් ආකාරයට සැළකීමෙන් වැළකෙන ක්‍රියාමාර්ග සහතික කිරීම.

**2. වයසට සරිලන සහ ප්‍රවේශවීම පහසුකම් ඇති පරිසරයක් ප්‍රවර්ධනය කිරීම**

වයසට සරිලන යටිතල පහසුකම්, නිවාස සහ ප්‍රවාහනය ඇතුලත්ව, සුරක්ෂිත, නිදහස් සහ අභිමානයෙන් යුතුව වැඩිහිටි පුද්ගලයින්ට ජීවත්විය හැකි, ශාරීරික වශයෙන් සහ සමාජීය වශයෙන් අඩංගු කරගන්නා වටපිටාවක් ප්‍රවර්ධන කිරීම.

3. **සෞඛ්‍ය සේවා සහ යහ පැවැත්ම පහසු කරවීම**

සෞඛ්‍ය ප්‍රවර්ධනය, රෝග වළක්වා ගැනීම, වැඩිහිටි නිවාරණ, මනෝ වෛද්‍ය සේවා, අසාධ්‍ය අවස්ථා උපස්ථාන සේවා සහ පුනරුත්තාපන සහාය වැනි සේවා ඇතුලත්ව, වැඩිහිටි පුද්ගලයින් සඳහා අංග සම්පූර්ණ පහසු මිලකට ගුණාත්මක සෞඛ්‍ය සේවා ලබාගැනීමේ හැකියාව ශක්තිමත් කිරීම.

4. **ආර්ථික සුරක්ෂාවට සහාය දීම සහ ජීවිකාව**

ශ්‍රම හමුදාවේ අඛණ්ඩව රැඳී සිටීම හෝ විකල්ප ජීවිකා වෘත්තීන් සඳහා අවස්ථා සැපයීම, මෙන්ම, තිරසාර විශ්‍රාම යෝජනාක්‍රම ශක්තිමත් කිරීම තුළින්, වැඩිහිටි පුද්ගලයින්ගේ ආදායම් සුරක්ෂතතාව සහතික කිරීම.

5. **සමාජීය අඩංගු කරගැනීම සහ සහභාගීත්වය සහතික කිරීම**

හුදෙකලාව සිටීම ගැන විශේෂ අවධානයක් යොමු කරමින් වැඩිහිටි පුදුගලයින්, සිය පවුලේ, ප්‍රජාවේ, සංස්කෘතියෙ සහ සිවිල් ජීවිතයේ ක්‍රියාකාරී අන්දමින් සිටීම සහ ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා සහාය දීම.

6. **දිගු කාලීන, අන්තර්කාලීන, අසාධ්‍ය අවස්ථා සහ විවේක සුව සේවා ශක්තිමක් කිරීම**

වැඩිහිටි පුද්ගලයින්ගේ සහකම්පන අන්තර්කාලීන සේවා සඳහා ප්‍රවේශය සහ කෙටි කාලීන විවේක අවස්ථා උපස්ථාන සහාය සපයමින් සහ ප්‍රජා පාදක, ආයකනික සහ නිවාස පාදක සේවා වැඩිදියුණු කිරීම සහ ව්‍යාප්තිය

7. **ජීවන ප්‍රගමණ ප්‍රවේශයක් තුළින් සම්බන්ධීකරණය සහ සමායෝජනය ඉහළ නැංවීම**

සෞඛ්‍ය සම්පන්නවූත් සුරක්ෂිතවූත් වියපත් බවක් සඳහා සූදානම් වීමේ හැකියාව අවධාරණය ඇතිව, ජාතික සංවර්ධන සැලසුම්කරණයට පුළුල් අන්දමින් වියපත් වීම අන්තර්ග්‍රහණය කිරීම සහ ඒ සඳහා අන්තර් ආංශික සහාය ප්‍රවර්ධනය කිරීම.

8. **නිරීක්ෂණ සාක්ෂි පාදක තීරණ ගැනීම සවිමත් කිරීම සහ වගවීම**

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා මගපෙන්වීමට, ප්‍රතිඵල තක්සේරුවට, පාරදෘෂ්‍යතාවට, තිරසාර බවට සහ අඛණ්ඩව වැඩිදියුණු වීමට පහසුකරලිය හැකි ක්‍රමවත් දත්ත රැස්කිරීමේ පර්යේෂණ, අධීක්ෂණ සහ ඇගැයුම් කිරීමට උචිත පහසු පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම.

## 6.0 ප්‍රධාන ප්‍රතිපත්ති ක්ෂේත්‍ර

### 6.1 වැඩිහිටි පුද්ගලයින්ගේ අයිතීන් හා සුරක්ෂිතතාව

ශ්‍රී ලංකාවේ වැඩිහිටි පුද්ගලයින්ගේ අභිමානය ස්වාධිකාරය සහ සුරක්ෂිතතාව සමාජය තුළ ආරක්ෂාවෙන පරිදි, ඔවුන්ගේ අයිතීන් සහ නිදහස, පූර්ණ වශයෙන් සුරැකෙන බව සහතික කළ යුතුය. මෙහිදී, ඔවුන්ගේ පොදු ජීවිතයේදී සහ පෞද්ගලික ජීවිතයේ දී, කිසිදු අපයෝජන, ප්‍රචණ්ඩතා, වෙනස්කොට සැළකීමට ලක්වීම, නොතකා හැරීමට ලක්වීම, සහ අවමන් සහගත ලෙස සැළකීම යනාදී අවස්ථාවලින් රැක ගැනීමද මීට ඇතුළත් වේ. මෙහිදී වැඩිහිටි කාන්තාවන්, වැඩිහිටි ආබාධිත පුද්ගලයින් යනාදී අනාරක්ෂිත කණ්ඩායම් කෙරෙහි විශේෂිත අවධානයක් යොමුකළ යුතුය.

*මූලික ක්‍රමෝපායික උපදෙස්*

- **නීතිමය රාමුව:**

වැඩිහිටි පුද්ගලයින් ඔවුන් ඉතා අනාරක්ෂිත වියහැකි අවස්ථාවේදී, ඔවුන්ගේ අභිමානය සහ සුරක්ෂාව සහතික කෙරෙන නෛතික ආවරණ ශක්තිමත් කිරීමෙහිලා නීති හඳුන්වා දීම සහ සංශෝධනය. වැඩිහිටි පුද්ගලයින් අපයොජනයෙන්, නොසළකා හැරීමෙන්, ප්‍රචණ්ඩත්වයෙන් සහ සූරාකෑමෙන් වළක්වන්නාවූ මෙන්ම ඔවුන්ට නෛතික සේවා සහන ලබා ගැනීමේ පහසුකම් සැපයෙන්නාවූ පරිදි ඔවුන් ආරක්ෂා කිරීම සඳහා දැඩි නීති ක්‍රියාත්මක කෙරෙන ආකාරයේ ක්‍රියා පිළිවෙත් දියුණු කිරීම. ඉදිරියේදී මතුවිය හැකි, තාක්ෂණය ආශ්‍රිත ප්‍රචණ්ඩ ක්‍රියා, මාර්ගගත පරිගණක වංචා, පරිගණක ආශ්‍රිත අඩන්තේට්ටම් සහ මුල්‍යමය සූරාකෑම් යනාදී අයථා ක්‍රියාද මීට ඇතුලත් වේ.

වැඩිහිටි පුද්ගලයින්ගේ වත්කම් රැකගැනීමේ නීති බලගන්වා, දැඩිව ක්‍රියාත්මක කිරීම.

වැඩිහිටි පුද්ගලයින් ඉලක්ක කරමින් සිදුකරන අපරාධ ඵලදායි ලෙස විමර්ශනය කර නඩු පවරා දඬුවම් කිරීම සඳහා නිශ්චිත වශයෙන් ක්‍රිය පිළිවෙත් සහ උපදෙස් මාලා හඳුන්වා දීම.

**සංස්කෘතිය, ආකල්ප සහ සහභාගිත්වය:** සමාජ සංස්කෘතික සංවේදීතාව වැඩිවීම, වැඩිහිටි පුද්ගලයින්ගේ සහභාගීත්වයට ගරුකිරීම, වැඩිහිටි අපයෝජනයෙන් තොරවීම, වියපත්භාවය, සහ වයෝවෘද්ධ අය පිළිබඳ සමාජයේ පවතින දුර්මතවලට ක්‍රියාකාරීව එරෙහිවීම.

**සේවා සැපයීමේ සමානාත්මතාව:** ප්‍රජා පාදක සහ සමාජ ආර්ථික තරාතිරම සහ/හෝ පදිංචි ප්‍රදේශය නොසළකා, වැඩිහිටි පුද්ගලයින්ගේ ආරක්ෂාව සහ සහාය සේවා සඳහා ඔවුන්ට සමාන ප්‍රවේශ අවස්ථා සැපයීම.

**නීති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම**: වැඩිහිටි අයිතිවාසිකම් නීති ඵලදායි ලෙසින් රැකෙනා පරිදි, වැඩිහිටි පුද්ගලයින්ගේ ප්‍රජා සහ සේවා සැපයීම් පිළිබඳ දැනුම්වත් කිරීම, උද්දේශණය සහ ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රණ පිළිබඳ තත්ත්වයන් ප්‍රවර්ධනය කිරීම.

**රජයේ ප්‍රතිපත්ති සැකසීම:** ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී සහ නව ප්‍රතිපත්ති හඳුන්වා දීමේදී, වැඩිහිටි පුද්ගලයින්ගේ සෞඛ්‍ය සමාජ උපස්ථානය සහ සුරක්ෂිතතාව කෙරෙහි රජයේ අවධානය යොමුකළ යුතුය.

**6.2 සෞඛ්‍ය සහ යහ පැවැත්ම**

වැඩිහිටි පුද්ගලයින්ගේ ජීවන තත්ත්වය, නිදහස සහ සමාජයේ ක්‍රියාකාරී සහභාගිත්වය පවත්නාගෙන යෑම උදෙසා, ඔවුන්ගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධන කිරීම අත්‍යවශ්‍ය වේ. මේ අරභයා, වැඩිහිටි පුද්ගලයින්ගේ, විවිධ වූ ශාරීරික, මානසික සහ සමාජීය අවශ්‍යතාවලට සරිලන සේ සැකසූ, දැරිය හැකි ගාස්තුවකට ප්‍රවේශ වීම පහසු, එමෙන්ම අංග සම්පූර්ණ සෞඛ්‍ය සේවා සැපයිය යුතුය. මෙහිදී නිදන්ගත රෝග වැළැක්වීම, සහ ප්‍රතිකාරය, මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය මෙන්ම සහනුකම්පන උපස්ථායක සහය සැපයීම කෙරෙහි අවධාරණය කෙරේ.

*මූලික ක්‍රමෝපායික උපදෙස්*

**සෞඛ්‍ය සේවා ප්‍රවේශය සහ ගුණාත්මක බව:** ප්‍රතිකාර, නිවාරණ, පුනරුත්තාපන, සහන සේවා සහ ජීවිතයේ අවසාන අවස්ථාවන්හිදී උපස්ථානය යනාදී සෑම මට්ටමකදීම වැඩිහිටි පුද්ගලයින්හට අංග සම්පූර්ණ සෞඛ්‍ය සේවා ලබා ගැනීමට සමාන අවස්ථා පවතින බව සහතික වීම. ගුණාත්මක, වයසට සරිලන සුහද සේවාවක් සැපයීම උදෙසා, ප්‍රාථමික සෞඛ්‍ය සේවා සහ දිගු කාලීන සත්කාරක සේවා බලගන්වන්න උපස්ථාන සේවා අංශ, ප්‍රමිතිගත ඇගයුම් ක්‍රම, බහුවිධ අංශ කණ්ඩායම්, පුනරුත්තාපන සේවා, උපදේශන සේවා, මහජන දැනුම්වත් කිරීම් සහ පවුල්/ප්‍රජා පාදක උපස්ථාන සැපයීම ඔස්සේ අන්තර්කාලීන උපස්ථාන සැපයීම ප්‍රවර්ධනය.

**සෞඛ්‍ය සම්පන්න වියපත්වීමේ වැඩසටහන් මූලාරම්භයන්:** ජීවිත ප්‍රගමණයේදී මානසික යහ පැවැත්මස සමග සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ප්‍රවර්ධනය කෙරෙන උද්දේශණ, දැනුම්වත් කිරීමේ සහ ධාරිතා ගොඩනැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. වයස ආශ්‍රිත සෞඛ්‍යමය අභියෝග වලින් පැනනගින කරදර අඩුකිරීම සඳහා උපස්ථායකයින්ට සහාය සැපයීම සහ ක්‍රියාකාරී අන්දමින් වියපත්වීමට දිරිමත් කිරීම.

**රෝග වළක්වා ගැනීම සහ කළමනාකරණය:** ප්‍රමාණවත් එන්නත්කරණ වැඩසටහන් සහ ප්‍රජාපාදක මැදිහත්වීම් ඔස්සේ, වැඩිහිටි පුද්ගලයින්ට බලපාන බෝවන සහ බෝ නොවන ලෙඩරෝග නිවාරණය, නිසි කලට ප්‍රතිකාර සැපයීම සහ පුනරුත්තාපනය කෙරෙහි ප්‍රමුඛතාව ලබා දීම.

**තාක්ෂණය සහ නවෝත්පාදනය:** වැඩිහිටි පුද්ගලයින්ට, සෞඛ්‍ය සේවා සැපයුම්වල ගුණාත්මක බව, ලබාගත හැකිවීම, කාර්යක්ෂමතාව යනාදීය සළකා ටෙලිබෙහෙත්, කෘතිම බුද්ධිය සහ අනෙකුත් නව්‍ය තාක්ෂණික ක්‍රම උපයෝගී කරගැනීම.

**ප්‍රතිකාර ලබාගැනීමේ පහසුව:** බටහිර ප්‍රතිකාර ක්‍රම මෙන්ම පාරම්පරික සහ නොමිලේ සැපයෙන වෛද්‍ය ප්‍රතිකාර ඇතුළු මෙරට සැපයෙන සියළු ආකාරයේ අනුමත වෛද්‍ය සේවා ප්‍රතිකාර වලින් ඕනෑම ක්‍රමයක් සාධාරණ ගාස්තුවකට, කාලීන සහ සමාන අවස්ථා සහිත රෝග පරීක්‍ෂා සහ ප්‍රතිකාර සහ චිකිත්සා ක්‍රම ලබාගැනීම සහතික වීම.

**6.3 මූල්‍ය සුරක්ෂිතතාව**

අභිමානයෙන්, නිදහසේ සහ සුරක්ෂිතව ජීවත්වීම උදෙසා වැඩිහිටි පුද්ගලයින්ට, ආර්ථික ස්ථාවරත්වය අත්‍යවශ්‍ය වේ. මේ අවශ්‍යතා අතර සවිමත් විශ්‍රාම ක්‍රමයක්, අඛණ්ඩ ආර්ථික සහභාගීත්වය සඳහා අවස්ථා මෙන්ම අනාරක්ෂිත වැඩිහිටි පුද්ගලයින් සඳහා ඉලක්කගත මූල්‍ය සහාය සාපයීමද පවතී.

***මූලික ක්‍රමෝපාය උපදෙස්***

**විශ්‍රාම ප්‍රතිව්‍යුහකරණය:** වැඩිහිටි පුද්ගලයින් අතර පවතින ආදායම් විෂමතාව අඩුකිරීමේ අටියෙන් හඳුන්වාදෙන සංශෝධන සහ නව්‍ය ආකෘති තුළින් සැමට සාධාරණ විශ්‍රාම ආවරණ ක්‍රමයක්, තිරසාර සහ ප්‍රමාණවත් අයුරින් ලබා දීම සහතික කිරීම.

**රැකියා සහ ජීවනෝපායට සහය සැපයීම:** වැඩිහිටි පුද්ගලයින් විසින් නිපදවන භාණ්ඩවලට වෙළෙඳපොල අවස්ථා සම්පාදනය ඇතුළුව, ඔවුන්ට අඛණ්ඩව ආර්ථිකයෙහි යෙදී සිටීම පහසුකරවන අයුරින්, නම්‍යශීලී සේවා කාලයක්, අර්ධ කාලීන රැකියා අවස්ථා සහ කුසලතා සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.

**මූල්‍යමය සහනාධාර:** ආර්ථික සුරක්ෂිතතාව වැඩවිමෙහිලා, බදු සහන, ඉතිරිකිරීම් සඳහා වැඩි පොළී අනුපාත, ජීවන වෘත්තියක් ගෙන යෑමට ණය පහසුකම්, අඩු ආදායම් ලාභී වැඩිහිටි පුද්ගලයින්ට මුදල් සහයක්, රක්‍ෂණ යෝජනා ක්‍රම යනාදි අවස්ථා සපයමින්, ජ්‍යෙෂ්ඨ පුරවැසි ප්‍රමුඛතා මූල්‍යමය ප්‍රතිලාභ සැපයීම.

**මූල්‍ය සාක්ෂරතාවය:** ඵලදායී මූල්‍ය කළමනාකරණය සඳහා ඉතිරිකිරීම්, ආදායම් සහ වියදම් කළමනාකරණය, වියදම්වල ප්‍රමුඛතාවය සහ ඩිජිටල් සාක්ෂරතාවය පිළිබඳ තොරතුරු සැපයීම.

**රැඳී සිටීමට ධෛර්යමත් කිරීම**

**ප්‍රජා පාදක වැඩසටහන්:** වැඩිහිටි පුද්ගලයින්ට සමාජ සහභාගීත්වය දිරිමත් කිරීමටත්, ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීම සහ සම-වයස් සහාය සැපයීම දිරිගන්වනසුළු,වැඩසටහන් සැකසීම, සහ ක්‍රියාත්මක කිරීම, මෙකී මූලාරම්භයන් තුළින් සමාජ කොන්වීම අඩුවීම සහායක ජාල ගොඩනැගීම, සහ ප්‍රජාවන් අතර අන්තර් පාරම්පරික සහයෝගීතාව ශක්තිමත් කිරීම උදෙසා උදව්දෙනු ඇත.

**අන්තර් පාරම්පරික සබඳතා**: තරුණ සහ වැඩිහිටි පරම්පරා අතර, අන්‍යොන්‍ය ගරුත්වය, අවබෝධය සහ සහයෝගය වඩවනාසුළු ක්‍රියාකාරකම් සහ ප්‍රතිපත්තිවලට සහය ලබාදී, ඒවා ප්‍රවර්ධනය කිරීම. එවැනි වැඩසටහන් මගින්, ධනාත්මක ආකල්ප සහ චර්යාවන් වැඩවීම සඳහා ජීවන ප්‍රගමණ ප්‍රවේශ යෙදවුම් ද ඇතුළත් පරම්පරා අතර පරතරය යා කිරීමටත්, පවුල් සහ ප්‍රජා සබඳතා ස්ථාපිත කිරීමටත් උදව් දේ.

**ප්‍රජා කටයුතුවල යෙදීමේ යටිතල පහසුකම්**: සමාජීය අන්තර් සබඳතා සහ සහය සැපයෙන අත්‍යාවශ්‍ය අවකාශ වශයෙන් සැළකෙන, දිවා මධ්‍යස්ථාන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ ජ්‍යෙෂ්ඨ පුරවැසි කමිටු පිහිටුවා, පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය ආයෝජන කිරීම. මෙකී පහසුකම් මධ්‍යස්ථාන තුළින් වැඩිහිටියන්ගේ විවිධ අවශ්‍යතා සැපිරීම.

ඉටුවන්නා වූ, ආකාරයෙන්, සමාන ප්‍රවේශ සහ යොමුවිය හැකි අවස්ථා ඇතිව, නිතිපතා නියාමනය වෙමින්, අධීක්ෂණයට ලක්වෙමින් පවත්වාගෙන යන බවට සහතික විය යුතුය.

**දිවිය පුරා ඉගෙනුම**: විශේෂයෙන්ම විවෘත විශ්වවිද්‍යාල සහ අනෙකුත් අධ්‍යාපන ආයතන වලට ඇතුළුවී, වැඩිහිටි පුද්ගලයින්ට විධිමත් සහ අවිධිමත් අධ්‍යාපනයේ, විනෝදස්වාද ක්‍රියාකාරකම්වල යෙදීමේ සහ කුසලතා සංවර්ධනය කරගැනීමේ අවස්ථා ව්‍යාප්ත කිරීම. සැමට යෙදී සිටිය හැකි, වයසට ගැලපෙන සහ බහුවිධ භාෂාවලින් මෙන්ම ආකෘති වලින් සැපයෙන ඉගෙනුම් අවස්ථා සැපයීම තුළින්, ඔවුන්ගේ ප්‍රජා යොමුවීම් ජීවන කටයුතු වලදී තාක්ෂණික ශිල්ප ක්‍රම පහසුවෙන් හැසිරවීමටත්, තොරතුරු සහ සේවාවන් වෙත යොමුවී අන් අය සමග සන්නිවේදනය කිරීමටත් හැකිවන අයුරින් ඔවුනට ඩිජිටල් කුසලතා, වර්ධනය කරගැනීමට සැලැස්වීම.

**සමාජ සහන සේවාවන්**: උදව් අවශ්‍ය කරන වැඩිහිටි පුද්ගලයින්ට සහාය සැපයෙන, උපස්ථායක සහය වැඩසටහන් සහ නිවාස වලට පැමිණ සහාය සපයන සේවා ලබාගත හැකි, පහසුවෙන් යොමුවිය හැකි, සහායක සේවා ගොඩනගා, පවත්වාගෙන යෑම. නිදහස් ජීවිතයක් සහ යහ පැවැත්මක් ගෙන යෑමට සහාය සපයන සමාජ අඩු මිල සේවා සහ සමාජ ආරක්ෂණ සේවා සපයා ගැනීමට සුදුසු සහායක උපාංග සහ තාක්ෂණය, පහසු මිලකට සැමට ලබාගත හැකි බව සහතික වීම.

### 6.5 දිගු කාලීන උපස්ථාන සහ සහායක සේවා

දෛනික ජීවන ක්‍රියකාරකම් අඛණ්ඩව අවශ්‍ය කරන වැඩිහිටි පුද්ගලයින්ගේ බහුවිධ අවශ්‍යතා සපුරාලීමට පැවතිය යුතු තීරණාත්මක අවශ්‍යතාවක් වන්නේ, අංග සම්පූර්ණවූත්, ගුණාත්මක වූත් දිගු කාලීන උපස්ථාන සේවා පවත්වාගෙන යෑමයි. වැඩිහිටි පුද්ගලයින්හට සුරක්ෂිත හා අභිමානය රැකෙන පරිසරයක් තුළ නිසි සහායක් ලබාගත හැකි, අයුරින් සැකසූ, නිවාස පාදක උපස්ථාන විකල්පවල සිට ආයතනගත පහසුකම් දක්වා අඛණ්ඩව සේවාවන් මීට ඇතුලත් වේ.

*ප්‍රධාන ක්‍රමෝපායික උපදෙස්*

**දිගු කාලීන උපස්ථාන ප්‍රමිතීන්**: නේවාසික උපස්ථාන ආයතන, ප්‍රජා පාදක උපස්ථානය සහ නිවාසයේ උපස්ථාන සපයන්නන් ද ඇතුළුව සියළු වැඩිහිටි උපස්ථාන සේවාවන්හි ගුණාත්මක ප්‍රමිතීන් ද ඒවා ලියාපදිංචි කිරීමේ ක්‍රමද, සකසා, එය දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම. මෙකී සියළු පද්ධති, අනවරථ, සහකම්පන සහ පුද්ගල කේන්ද්‍රීයව පවත්වා ගැනීම, මෙයින් සහතික කෙරෙනු ඇත. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ දිගු කාලීන උපස්ථාන පහසුකම් සේවා, වැඩිහිටියන් සඳහා ජාතික මණ්ඩලය විසින් උපදෙස් සැපයෙන පරිදි වැඩිහිටි පුද්ගලයින් පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් අධීක්ෂණය කර, නියාමනය කරනු ඇත.

**උපස්ථායක ධාරිතා වර්ධනය සහ සහාය:** කෙටි කාලීන සහ මධ්‍ය කාලීන පුහුණුව සපයමින්, පුහුණු උපස්ථායකයින්ගේ හිඟය මගහැරවීම. උසස් ප්‍රමිතියෙන් යුතු උපස්ථායකයින්ට සහ පවුලේ අයට කුසලතා වඩවන ප්‍රතීතන පුහුණු වැඩසටහන් පිහිටුවීම. විඩාපත්වීම වලක්වා උපස්ථාන ප්‍රතිඵල දියුණු කරගැනීම උදෙසා, උපස්ථායකයින්ට මූල්‍ය සහාය, කෙටි කාලීන විවේකය සහ භාවමය සහාය ලබා දීම. පවත්නා ප්‍රතීතන පුහුණු මධ්‍යස්ථානවල ප්‍රමිතිය පවත්නාගෙන යෑම සහ වැඩෙන ඉල්ලුමට සරිලන ධාරිතා වර්ධනය සැපයීම සඳහා අඛණ්ඩව අධීක්ෂණය සහ ඇගයුම.

**දිගු කාලීන උපස්ථායක ශ්‍රම හමුදවක් ගොඩනැගීම සහ නියාමනය:** දිගු කාලීන උපස්ථායක ශ්‍රම හමුදව නිතිපතා ඇගයුමට ලක්කිරීම සහ ජාතික මෙන්ම ප්‍රාදේශීය මට්ටමින් සැපයීම. අනාගත ශ්‍රම හමුද අවශ්‍යතා පුරෝකතනය කරමින් බඳවා ගැනීමේ ක්‍රමෝපායන් ශක්තිමත් කිරීම. (පුහුණු සේවකයින්)

**දිගු කාලීන උපස්ථාන සේවා පහසු ගාස්තුවකට ලබාගැනීම සහ ඒ සඳහා සමාන අවස්ථා ඇති කිරීම:** වැඩිහිටි පුද්ගලයින් වැඩි දෙනාගේ හිතසුව පිණිස, අඩු ආදායම්ලාභී මෙන්ම අනාරක්ෂිත වැඩිහිටියන් සඳහා අඩු ගාස්තුවකට සැපයෙන දිගු කාලීන උපස්ථාන ගොන්නක් සහ දිගු කාලීන රක්ෂණ ක්‍රම සපයා දීම. විශේෂයෙන් නිවාස පාදක උපස්ථාන සේවා වෙනුවෙන් උපස්ථාන සැපයීම වැඩිදියුණු කිරීමට තාක්ෂණය හඳුන්වා දීම.

### 6.6 වයසට ඔබින වටපිටාවක්:

වැඩිහිටි පුද්ගලයින්ට සුරක්ෂිතතාව, නිදහස, සහ ක්‍රියාකාරී සහභාගීත්වය සඳහා ඉඩකඩ විවෘත වටපිටාවක් සපයා දීම, ඔවුන්ගේ යහ පැවැත්ම සහ ජීවන තත්ත්වය පවත්වාගෙන යෑමට මූලික වේ. වැඩිහිටි පුද්ගලයින් සිය ප්‍රජාව තුළම සැප පහසුවෙන් විසීම සඳහා, ශාරීරික, සමාජීය සහ සේවා ආශ්‍රිත කාරණා සැළකීම, මෙකී වයසට ඔබින වටපිටාවේ අරමුණයි.

*ප්‍රධාන ක්‍රමෝපායික උපදෙස්*

**පහසුවෙන් සපයාගත හැකි ජීවත්වීමේ ඉඩකඩ/නිවාස:** වැඩිහිටි පුද්ගලයින්ට නිදහසේ, අභිමානයෙන් යුතුව ජීවත්වීමේ ඉඩකඩ පවතින, සහන මිලකට ගතහැකි, ආරක්ෂිත සහ පහසුවෙන් ලබාගත හැකි ආකාරයේ වයසට සරිලන සැලසුම් නිර්මාණ ආකෘති නිවාස විසඳුම් සැලසීම.

**නේවාසික උපස්ථාන විධිවිධාන:** සුරක්ෂිත මැනුෂීය සහ කඩනමින් ප්‍රතිචාර දක්වන උපස්ථාන පරිසරයක් සපයනුවස්, නේවාසික උපස්ථාන සහ සාත්තු නිවාස ද ඇතුළුව දිගු කාලීන උපස්ථාන පහසුකම් පිළිබඳ ගුණාත්මක ප්‍රමිතීන් සහ නියාමන ගොඩනගා, බලාත්මක කිරීම.

**පොදු යටිතල පහසුකම් සහ ප්‍රවාහනය:** පොදු ස්ථාන, පොදු ප්‍රවාහන සේවා, පදික වේදිකා, උද්‍යාන සහ නාගරික යටිතල පහසුකම් යනාදියේ පහසුවෙන් භාවිතා කළ හැකි බව, සුරක්ෂිතතාව සහ සැවොම අඩංගු කරගන්නා ස්වභාවය, වැඩිදියුණු කිරීම වැඩිහිටි පුද්ගලයින්ගේ ඔබ-මොබ යෑමේ පහසුව සහ ඔවුනට සමාජීය කටයුතුවල සහභාගීත්වය පහසු කරනුවස්, වයසට සරිලන පොදු ප්‍රවාහන පහසුකම් විකල්ප අවස්ථා වැඩිදියුණු කිරීම.

### 6.7 හදිසි අවස්ථාවකට ඇති සූදානම

හදිසි අවස්ථාවකදී, සහ ව්‍යසනයකදී, වැඩිහිටි පුද්ගලයින් බොහෝවිට වැඩි අනාරක්ෂිත බවකට මුහුණුපාන බැවින් සූදානම, ප්‍රතිචාර සහ යථා තත්ත්වයට පත්වීම යනාදී සෑම අදියරයකදීම ඔවුන්ගේ අවශ්‍යතාවලට විශේෂිත අවධානයක් යොමුකළ යුතුවේ.

*ප්‍රධාන ක්‍රමෝපායික උපදෙස්*

**හදිසි අවස්ථා ප්‍රතිචාර පද්ධති:** ස්වභාවික සහ මිනිසා විසින් නිර්මිත ව්‍යසනයක සමුච්ඡනය නොකළ දත්ත පදනම් කරගෙන ප්‍රථමාධාර සහ කඩිනම් සහාය සැපයීමේ ක්‍රම, වැඩිහිටි පුද්ගලයින්ගේ අවශ්‍යතා වෙනුවෙන්ම යොමුවූ ප්‍රමුඛතාවකින් ක්‍රියාත්මක කිරීම සඳහා ඒවැන්නක් සැකසීම.

**ව්‍යසන සැලසුම්කරණයේ අඩංගුවන බව:** කාලගුණ විපර්යාස, වසංගත සහ ආර්ථික අර්බුධ ආශ්‍රිත අභියෝගවලට පිළිතුරු සෙවීමේදී, සකසන, ව්‍යසන අවධානම අඩුකෙරෙන සහ අර්බුධ කළමනාකරණ සැලසුම් වලදී, වැඩිහිටි පුද්ගලයින්ගේ අවශ්‍යතා සහ හඬ ඒවාට අංගසම්පූර්ණ වශයෙන් ඇතුලත් කිරීම.

**විශේෂ සෞඛ්‍ය සහ සමාජ සේවා:** හදිසි අවස්ථාවලදී, වැඩිහිටි පුද්ගලයින්ට ප්‍රතිකාර පහසුකම්, ශාරීරික ආධාරක මෙවලම් සහ මනෝ වෛද්‍ය සහාය යනාදී අත්‍යාවශ්‍ය සෞඛ්‍ය සහ සමාජ උපකාරක සේවා අඛණ්ඩව පැවතීම සහ සැපයීම සහතික වීම.

**6.8 ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය**

ප්‍රතිඵල සාධන සහ තිරසාර ප්‍රතිඵල ඉටුවීම සහතික වීමට නම්, වැඩිහිටි පුද්ගලයින් සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මනා සම්බන්ධීකරණ උත්සාහයන්, ප්‍රමාණවත් සම්පත් මූලාශ්‍ර සහ දත්ත ආශ්‍රිත තීරණ ගැනීමේ ක්‍රියාවලියක් අවශ්‍ය වේ.

*ප්‍රධාන ක්‍රමෝපායික උපදෙස්*

**අන්තර් ආංශික සම්බන්ධීකරණය:** වයෝවෘද්ධ ප්‍රතිපත්තිය කෙරෙහි ඒකාබද්ධ සහ සඵලදායි ප්‍රවේශයක් සාක්ෂාත් කරගැනීමෙහිලා ආණ්ඩුවේ නියෝජිත ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය සහ ප්‍රජා කණ්ඩායම් අතර සහයෝගීතාව සහ සන්නිවේදනය බලගැන්වීම.

**ශ්‍රම හමුදාව:** වැඩිහිටි පුද්ගලයින් සඳහාවන ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා, ශ්‍රම හමුදාව බලගැන්වීම.

**රාජ්‍ය-පෞද්ගලික අංශ හවුල්කාරීත්වය:** සම්පත් උපයෝජනය, තාක්ෂණික විශේෂඥතාව සහ සේවා සැපයීම, ප්‍රශස්ත කිරීම සඳහා රාජ්‍ය ව්‍යුහයන් සහ පෞද්ගලික ආශ්‍රිත පාර්ශව අතර හවුල්කාරීත්වය ප්‍රවර්ධනය කිරීම.

**මුදල් විසර්ජනය සහ සම්පත් ඒකරාශීකරණය:** වයස්ගත කටයුතු මූලාරම්භයන් සඳහා මූල්‍ය සම්පාදනය පිණිස නව්‍ය මූල්‍යකරණ ක්‍රමවේද පිළිබඳ ගවේෂණය කරමින් මෙම ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාත්මක කෙරෙන ප්‍රමුඛතා සඳහා ප්‍රමාණවත් වූත් තිරසාරවූත් අරමුදල් සම්පාදනය කිරීම.

**නිරීක්ෂණ සාක්ෂි පාදක ප්‍රවේශ:** ප්‍රතිපත්ති සංවර්ධනය, වැඩසටහන් සැලසුම් සහ අධීක්ෂණය යන ක්ෂේත්‍රවලට තොරතුරු සැපයීම උදෙසා, වියපත්වීම ආශ්‍රිත දත්ත රැස්කිරීමේ පද්ධති වැඩිදියුණු කිරීම, පර්යේෂණ ධාරිතාව ගොඩනැගීම සහ මධ්‍යගත ජාතික දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම.

**6.9 අධීක්ෂණය සහ ඇගැයුම**

මෙම ප්‍රතිපත්තියෙන්, වැඩිහිටි පුද්ගලයින්ගේ මතුවිය හැකි අවශ්‍යතා කෙරෙහි ඇතිකරන අදාලත්වය සහ කඩිනමින් ප්‍රතිචාර දැක්වීම සහතික කරනුවස්, මෙය අඛණ්ඩව අධීක්ෂණය සහ ඇගැයීම කළ යුතුය.

*ප්‍රධාන ක්‍රමෝපායික උපදෙස්*

**බහු ආංශික අධීක්ෂණය:** ප්‍රගතිය සහ බලපෑම හසුකරගැනීම සඳහා අංශ අතර අංග සම්පූර්ණ අධීක්ෂණ ආකෘති සහ ප්‍රතිඵල සංරචක ගොඩනැගීම.

**ස්වාධීන අධීක්ෂණය:** නිතිපතා ඇගැයුම් කරමින් වගවීම සාක්ෂාත් කිරීම සඳහා දේශපාලන නායකත්වය මගින් සහාය සැපයෙන ස්වායක්ත ව්‍යූහයක් පිහිටුවීම.

**වාරානුරූප සමාලෝචන:** හිඩැස් හඳුනාගැනීම සහ ප්‍රතිපත්ති සංශෝධන සහ වැඩිදියුණු කිරීම් දැනුම් දීම සඳහා ක්‍රමානුකූල සහ කාලීන තක්සේරු කිරීම් පැවත්වීම.

**6.10 උද්දේශණය, දැනුම්වත් කිරීම සහ සන්නිවේදනය**

වියපත්වීම කෙරෙහි සමාජීය අවබෝධය සහ ධනාත්මක ආකල්ප ගොඩනැගීම තුළින් වැඩිහිටි පුද්ගලයින්ගේ යහ පැවැත්ම සහ ඔවුන් සමාජයට අඩංගු කරගැනීම කෙරෙහි සහාය වේ.

*ප්‍රධාන ක්‍රමෝපායික උපදෙස්*

**මහජනතාව දැනුම්වත් කිරීමේ ප්‍රචාරක ව්‍යාපාර:** වැඩිහිටියන්ට ගරුකිරීම, වියපත්වීමට අභියෝග කිරීම පිළිබඳව ප්‍රචාරක ව්‍යාපාර දියත් කරමින්, වියපත්වීම සහ වැඩිහිටි පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ නිරවද්‍ය තොරතුරු සැපයීම.

**ප්‍රජාව සමග වැඩ කිරීම:** උද්දේශණ සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ක්‍රියාකාරී අන්දමින් සහභාගීවීම සඳහා වැඩිහිටි පුද්ගලයින් බලාත්මක කිරීම.

**මාධ්‍ය සහ සන්නිවේදනය:** වැඩිහිටි අයිතිවාසිකම්, පවත්නා සේවාවන් සහ සෞඛ්‍ය සම්පන්න වියපත්වීමේ පරිචයන් පිළිබඳව තොරතුරු විසුරුවා හැරීම උදෙසා විවිධවූ මාධ්‍ය පීඨිතා උපයෝගී කරගැනීම.

**ධාරිතා ගොඩනැංවීම:** වියපත්වීම ආශ්‍රිත ගැටළු සහ සැවොම අඩංගු කරගන්නාවූ භාවිතාවන් පිළිබඳව, සේවා සපයන්නන්, ප්‍රජා නායකයින් සහ ආශ්‍රිත පාර්ශව සඳහා පුහුණුව ලබාදීම.